(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක **169**.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2017 මැයි මස 26 වැනි සිකුරාදා පූ. භා. 10.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **මහින්ද අමරවීර මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා,** විශේෂ කාර්යභාර අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **පලනි දිගම්බරම් මහතා,** කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා

ගරු **දුමින්ද දිසානායක මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **එස්. බී. දිසානායක මහතා,** සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා

ගරු **එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **අර්ජුන රණතුංග මහතා,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **චන්දිම වීරක්කොඩි මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **මහින්ද සමරසිංහ මහතා,** වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **ටී. බී. ඒකනායක මහතා,** ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වී. එස්. රාධක්‍රිෂ්ණන් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත සේනානායක මහතා,** වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා,** පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **සුමේධා ජී. ජයසේන මහත්මිය,** තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා,** අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා සහ බුද්ධශාසන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික බණ්ඩාරනායක මහතා,** නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරානාත් බස්නායක මහතා,** විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා

ගරු රංජිත් අලුවිහාරේ මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු චන්දිම ගමගේ මහතා

ගරු සිරිපාල ගමලත් මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු මලිත් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**

**ගරු තාරක බාලසූරිය මහතා**

**ගරු විජිත බේරුගොඩ මහතා**

**ගරු සෙය්යිඩ් අලී සාහිර් මවුලානා මහතා**

**ගරු ඉම්රාන් මහරුෆ් මහතා**

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**

**ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා**

**ගරු බිමල් රත්නායක මහතා**

**ගරු ඉෂාක් රහුමාන් මහතා**

**ගරු මුජිබුර් රහුමාන් මහතා**

**ගරු ගාමිණී ලොකුගේ මහතා**

**ගරු ජානක වක්කුඹුර මහතා**

**ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා**

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**

**ගරු චමින්ද විජේසිරි මහතා**

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

**ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**

**ගරු සන්දිත් සමරසිංහ මහතා**

**ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

**ගරු ඊ. සරවනපවන් මහතා**

**ගරු අන්නාමලෙයි නඩේසු සිවශක්ති මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු කනක හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, 2011, 2012 සහ 2013 වර්ෂ සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා පිළිගන්වා, එම වාර්තා ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, 2016 වර්ෂය සඳහා ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව තරුණ, ක්‍රීඩා, කලා හා උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, 2016 අංක 24 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය යටතේ 2017.04.01 සිට 2017.04.30 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිගන්වා, එම පරිපූරක වෙන්කිරීම් පිළිබඳ වාර්තාව රාජ්‍ය මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, 2016 වර්ෂය සඳහා කිළිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන හා වාර්ෂික ගිණුම් වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අභ්‍යන්තර පරිපාලන හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, 2016 වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. කාරක සභා වාර්තා පිළිගැන්වීම :** (1) ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු චමල් රාජපක්ෂ මහතා වෙනුවෙන් එහි සභික ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා විසින්, ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද "2014 වර්ෂය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව", "2013 සහ 2014 වර්ෂ සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තා" සහ "2016 වර්ෂය සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව, පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) සෞඛ්‍ය හා මානව සුහසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු ලකී ජයවර්ධන මහතා විසින්, සෞඛ්‍ය හා මානව සුහසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද "2017 අංක 2 දරන පනතින් සංශෝධිත 2013 අංක 1 දරන දිවිනැගුම පනත යටතේ නියෝග" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව, පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(3) ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු රංජිත් අලුවිහාරේ මහතා විසින්, ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද උතුරු පළාත් සංචාරක අධිකාරියේ ප්‍රඥප්ති කෙටුම්පත සම්බන්ධයෙන්, එම කාරක සභාවේ අතුරු වාර්තාව, පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**3. පෙත්සම්** :

(1) නුගේගොඩ, නාලන්දාරාම පාර, අංක 64 ඒ දරන ස්ථානයෙහි පදිංචි කිංස්ලි ඩෝසන් මහතාගෙන් ලැබුණු 2016.09.30 දිනැති පෙත්සම ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) වත්තල, පරණ කන්ද වත්ත, අංක 58 දරන ස්ථානයෙහි පදිංචි බී. එස්. චන්ද්‍රසිරි පෙරේරා මහතාගෙන් ලැබුණු 2016.11.21 දිනැති පෙත්සම; සහ

(ii) අනුරාධපුර, මිහින්තලා පාර, කන්නට්ටිය, යුනිට් 8/1 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. එම්. පී. සරත් කුමාර මහතාගෙන් ලැබුණු 2017.02.19 දිනැති පෙත්සම

ගරු දුමින්ද දිසානායක මහතා විසින් පිළිගන්වන ලදී.

(3) මාතර, හිත්තැටිය මැද, මැදගෙදරවත්ත යන ලිපිනයෙහි පදිංචි පී. ඩී. රත්නපාල මහතාගෙන් ලැබුණු 2017.03.22 දිනැති පෙත්සම ගරු බුද්ධික පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

(4) (i) බණ්ඩාරවෙල, අඹතැන්නවත්ත, 2 වැනි පටුමග, අංක 20 ඒ දරන ස්ථානයෙහි පදිංචි එස්. එස්. නඩරාජ් මහතාගෙන් ලැබුණු 2017.02.22 දිනැති පෙත්සම; සහ

(ii) බණ්ඩාරවෙල, අඹතැන්නවත්ත, 2 වැනි පටුමග, අංක 20 ඒ දරන ස්ථානයෙහි පදිංචි එස්. එස්. නඩරාජ් මහතාගෙන් ලැබුණු 2017.02.19 දිනැති පෙත්සම

ගරු අ. අරවින්ද් කුමාර් මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 25අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. උතුරු පළාත් සංචාරක අධිකාරිය ප්‍රඥප්ති කෙටුම්පත :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 46 අ (3) (අ) සහ (ආ) හි විධිවිධානවල කුමක් සඳහන් වුවද, කථානායකතුමා විසින් 2017 මැයි මස 03 වන දින යොමු කරන ලද උතුරු පළාත් සංචාරක අධිකාරිය ප්‍රඥප්ති කෙටුම්පත පිළිබඳව, ස්වකීය වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට ලබා දී ඇති කාල සීමාව 2017 ජූලි මස 03 වැනි දින දක්වා දීර්ඝ කළ යුතුය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු විමලවීර දිසානායක මහතා, ගරු වීරකුමාර දිසානායක මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත කෘෂිකර්ම අමාත්‍යතුමා වෙත පවරන ලදී.

රැස්වීම තාවකාලිකව අත්හිටවීම

පූ.භා. 11.42

මධ්‍යාහ්න 12.00 වනතෙක් රැස්වීම තාවකාලිකව අත්හිටවන ලදී.

මධ්‍යාහ්න 12.00

රැස්වීම යළිත් එක්රැස්වූයෙන් නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

**6. දිවිනැගුම පනත යටතේ නියෝග :** සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2017 අංක 2 දරන පනතින් සංශෝධිත 2013 අංක 1 දරන දිවිනැගුම පනතේ 42 වගන්තිය යටතේ සහ එකී පනතේ 25(2) සහ 29(2) වගන්ති සමඟ කියවිය යුතු, 42 වගන්තිය යටතේ සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මාර්තු 07 දිනැති අංක 2009/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.05.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අ. භා. 12.32 ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. කල් තැබීම :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තුවේ සභානායකතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 1.56 ට, අද දින සභා සම්මතිය අනුව, 2017 ජූනි මස 06 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.